
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND
*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



# නොසිතූ දෙයක් සිදුවූ හැටි!



ඇමරිකාවේ නව ජනාධිපති බැරක් හුසේන් ඔබාමා මහතා

**ඇ**මරිකා එක්සත් ජනපදය ඉතිහාසයේ ප්‍රථමවරට අප්‍රිකානු-ඇමරිකානු සම්භවය ඇති ජනාධිපතිවරයෙකු ගිය සතියේ ඡන්දයෙන් පත් කරගත්තාය. ඒ ඩිමෝක්‍රැටික් පක්ෂයේ 47 වියැති බැරක් හුසේන් ඔබාමාය. ඔහුට ඡන්ද ආසන 349 ක් ලැබුණු අතර, රිපබ්ලිකන් පක්ෂයෙන් තරඟකර පරාජයටපත් ඇමරිකානු සුදුජාතික 72 හැවිරිදි ජෝන් මැකේන්ට ඡන්ද ආසන 162 ක් ලැබිණ.. ඔබාමා ලැබූයේ ඉතා විශාල ජයක් බව පැහැදිලි ය.

ඔබාමා තනිකරම සුද්දෙකු නොවේ. කළු සුදු මිශ්‍රණයකි. ඇතැම් අය ඔහු කල්ලෙකු ලෙසද ඇතැමෙක් ඔහු දෙමුහුන් ලෙසද සඳහන් කරති. එහෙත් එවැන්නෙක් මේතාක් සුද්දන් පමණක් අසුන්ගත් ධවල මන්දිරයේ ජනාධිපති පුටුවේ වාඩිවනු ඇතැයි ලොව කිසිවෙකු මේ පසුගිය දා වනතුරු හීනෙකින් වත් සිතුවේ නැත. එසේ විය හැකි යයි ඡායාමාත්‍රයක සිතුවිල්ලක් ආවා නම් ඒ ආවේ ඔබාමා ජනපති තරඟයට පිවිසෙන්නට නම් දුන්නාට පසුවය. ඔහු ජනාධිපති වනු ඇතැයි සමහරුන් අනුමානකළ ද එය කිසිවෙකු ස්ථිර ලෙස සිතූ සිතුවිල්ලක් නම් නොවේ.

වහලුන් ලෙස ඇමරිකාවට ගෙන ආ අප්‍රිකානු කල්ලන්ට කිසිදු නිදහසක්, මිනිස් අයිතිවාසිකමක් සුදු ඇමරිකානුවන් දුන්නේ නැත. සිවිල් අයිතිවාසිකම් පතා ලක්ෂ දස ලක්ෂවාරයක් කලු මිනිසුන් උද්ඝෝෂණ කරන්නට හා පෙළපාලි යන්නට ඇත. එහෙත් කිසිවක් නොලැබිණ. 1870 මාර්තු 31 වෙනි දින වහලෙකුගේ පුතෙකු වන **තෝමස් මුන්ඩි පීටර්සන්** නම් අප්‍රිකානු ජාතිකයා ඊට පෙර කිසිදු කලු ජාතිකයෙකු නොකළ දෙයක් කළේය. එනම් ඡන්දය පාවිච්චි කළ ඇමරිකාවේ ප්‍රථම කලු ජාතිකයා වීමයි. ඊට වසර 5 කට පෙර ඇමරිකානු ව්‍යවස්ථාව මගින් එහි වහල්කම තහනම්කර තිබිණ. පීටර්සන් එදා ලැබූ යාන්තම් නිදහස ක්‍රමයෙන් දළු ලලා ඇවිත් වසර 138 කට පසු ඇමරිකාවට කල්ලෙක් ජනාධිපති තනතුරට තෝරාපත්කර ගන්නට තරම් හිතහදාගන්නට හැකිවිය.

පීටර්සන් ට ඡන්දය දෙන්නට හැකි වීම වහල්භාවයට පත්ව සිටි ඔහුගේ කලු ජාතික නෑ හිතවතුන්ට අදහාගත නොහැකි විෂ්මයජනක දෙයක් විය. එසේම කල්ලෙක් කිසිම කලෙක ඇමරිකාවේ ජනාධිපතිවනු ඇතියි පීටර්සන් එදා හීනෙන් හෝ සිතන්නට නැතුවා නිසැකය.

ඉහතකී ඡන්ද නිදහසට පසු කලු ජාතිකයන්ට අනෙක් සුදු අයට මෙන් සමානව සලකන්නට ලැස්තිවන බවක් මුලින් පෙනුනද ඉතා ඉක්මනින් එය නැතිවීගියේය. කලු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ හීන වියැකිණ. පෙර මෙන්ම කලු ළමයින්ට සුද්දන් යන පාසැල් තහනම් වීය. කලු ළමයෙක් පන්තියකට ඇතුල් කරගනු ලැබුව හොත් සුදු ළමයි ඒ පාසැලෙන් අස්වී ගියහ. කලු මිනිසුන්ට හිරිහැර කරන, ඔවුන්ට ශාරීරික හානි පමුණුවන **Ku Klux Klan** නම් වර්ණවාදී සුදු රහස් සංවිධානයක් ද බිහිවිය. ඔවුහු කලු මිනිසුන්ගේ නිවාසවලට ගිනි තැබීමද, බොරු චෝදනාවලට ඔවුන් පටලවා අත්අඩංගුවට ගෙන කඹයක් ගසක ගැටගසා එල්ලා මැරීමද සිදුකළහ. 1889 සිට 1922 දක්වා එසේ එල්ලා මැරූ ගණන 3500 කි. සුදු අය යන බස්වල කලු අයට යෑම තහනම් වූ අතර වාඩිවී සිටින කලු අය බසයට නැගෙන සුදුඅයට නැගිට ඉඩදිය යුතු වීය. එසේ නොදීම හිරේ යන වරදක් බවට නීතිගත වීය.

මෙම සාපරාධී ක්‍රියාවන්ට එරෙහිව ඇමරිකාවේ කලු ජනතා උද්ඝෝෂණ නැගුණි. දේවගැතිවරයෙකු වූ මාටින් ලූතර් කිං සිවිල් අයිතිවාසිකම් ඉල්ලමින් මෙහි පෙරමුණ ගත්තේය. ඔහුට සාමය සඳහා නොබෙල් තෑග්ගද හිමිවිය. මේ අතරේ 1968 අප්‍රියෙල් මස සුදු සාහසිකයෙකු විසින් ලූතර් කිං වෙඩිතබා මරණ ලදී. කිං 1963 දී වොෂිංටනයේ සිවිල් අයිතිවාසිකම් පතා පැවති දැවැන්ත රැළියේදී ප්‍රකාශ කළේ තමා කලු මිනිසුන්ගේ අනාගත නිදහස ගැන හීනයක් දකින බවය. මේ 2008 දී, අද, **බැරක් ඔබාමා** සැබෑවක් බවට පත් කළේ ඒ සිහිනයයි.

♦ **වෙනුර**



**Family Man**

The new US President Senator **Barack Obama** with his wife **Michelle** and two daughters - **Malia** (ten) and **Sasha** ( seven) in a relaxed pose at his garden just days before the Presidential Election.



**Assassinated Civil Rights leader - Martin Luther King**



## ඉතිහාස පොතට අළුත් පිටුවක්

**ඉ**තිහාසය පුදුම දෙයක් ලෙස මම හැම දා ම සැලකුවෙමි. ඉතිහාස යන්නෙහි අර්ථය 'එසේ සිදුවීය' යන්නයි. සටහන්ව ඇති දේවල් අතර ඇති පුදුමාකාරවූ දේ අනාගත පරපුර පුදුමයට පත්කරනු නොඅනුමානය. ඉතිහාසයේ ආශ්චර්යය ද එයයි.

අපට මතක ඇති කාලයේ සිට බටහිර ලෝකයේ සුදු කලු භේදය පවතින බව අපි දනිමු. ඊට සමාන්තරව අතීතයේ සිට මේ මෑතක් වන තුරු වහල් වෙළඳාම සිදුවීය. එය විස්තරකිරීම මෙහි අනවශ්‍යය. එය කෙබඳුදැයි මුලු ලොවම දනී. සුදු කලු භේදය උග්‍රව පැවති ඇමරිකාවේ ඉහළ තැන්වල සිටියෝ සුදු ඇමරිකානුවෝය. කලු මිනිසුන්ට ඉහළට යාමට තිබූ ඉඩ කඩ සීමා විය. බොහෝ කාලයක සිට සිවිල් අයිතිවාසිකම් සඳහා කලු මිනිසුන් ලක්ෂවාරයක් පෙළපාලි යන්නට ඇත. උද්ඝෝෂණ කරන්නට ඇත.ඒ වෙනුවෙන් දහස් ගණක් ගුටිබැට කන්නට ඇත. හිරේ යන්නට ඇත. මැරුම් කන්නට ඇත. ඉතිහාසය එයයි. එහෙත්........

ඒ ඇමරිකාවේ කිසිදාක සිදු නොවේ යයි කවුරුත් සිතූ දෙයක් අද උදෑසන 2008 නොවැම්බර් 05 වෙනි දා සිද්ධවීය. එනම් ඉතිහාසයේ ප්‍රථම වරට කලු ජාතිකයෙකු ඇමරිකාවේ ජනාධිපතිවරයා ලෙස තේරී පත්වීමයි. සැබැවින්ම එය ප්‍රීතියෙන් මහ පොළව ගිගුම් දිය යුතු අසිරිමත් දෙයකි. කිසිදා සිදුවන්නේ නැතැයි සිතූ දේවල් සිද්ධවෙන බව දැන්වත් ලොව වටහාගත යුතු ය. මෙය ඉතිහාස පොතට අලුතින් ලියා එක් කළ පිටුවකි.

මිනිසෙකුට හඳට යන්නට බැරියයි සිතූ නමුත් ඔහු හඳට ගියේ ය. කිසිදාක නොවැටේයයි සිතූ සෝවියට් රාජ්‍යය කඩා වැටිණ. හැමදාම පවතීවි යයි සිතූ දකුණු අප්‍රිකාවේ සුද්දන්ගේ ඇපාතයිඩ් පාලනය කෙළවර විය. එසේම කිසිදාක ශ්‍රී ලංකා හමුදාවට පරාජය කරන්නට බැහැ යයි කිවූ දෙමළ කොටි ත්‍රස්තවාදයේ කෑලි දවසින් දවස ගැලවී වැටෙන හැටි දැන් පෙනේ. ලොව කිසිවක් හැමදා නොපවතී. සත්‍යය එපමණකි. එය වසර දෙදහස් පන්සීයක් පුරා නිසැකවම අපි දැන සිටිමු.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතෝපදේශයෙන්

ලොකයාත්‍රා භයං ලජ්ජා - දාක්ෂිණ්‍යං ත්‍යාගශීලතා
පඤ්ච යත්‍ර න විද්‍යන්තෙ -න කුර්‍යාත්තත්‍ර සංස්ථිතිම්

***අර්ථය*** : ජීවිකාව ද, බිය ද, ලජ්ජාව ද, අනුකූලබව හා ත්‍යාගශීලීබව යන පහ යම් ප්‍රදේශයක නොදක්නා ලැබෙත් ද, ඒ දේශයේ විසීම නොකරන්නේ ය.


**කෙ**නෙකුට යහතින් ජීවත්වීමට හොඳ වටපිටාවක් නොඑසේ නම් හොඳ පරිසරයක් අවශ්‍ය ය. ඊට අවශ්‍ය කරන සාධක ගැන බොහෝ දෙනෙකුට අවබෝධයක් නැත. සතුටින් සමාදානයෙන් ජීවත්වීමට සිතන්නේ නම් එම සාධක දැන සිටිය යුතු ය. ජීවත්වන පරිසරය ගැන අවබෝධයක් නැත්තාට බාධක හා ගැටළු ගලා එනු ඇත. ඊළඟට ඒවාට පිළියම් සෙවීමට වෙහෙස වන නිසා තම අනෙක් කටයුතු අඩාල කරගනී. ඒනිසා අප ජීවත් වන පරිසරය කවර ආකාරයකින් අපට බලපෑම් එල්ල කරන්නේදැයි සැලකිලිමත් විය යුතු ය. විශේෂයෙන් දරුවන් සහිත පවුල් මේ ගැන වඩාත් කල්පනාකාරී වීම යෙහෙකි. ළමයි තමා ජීවත්වන පරිසරයෙන් බොහෝ දේ ඉතා ඉක්මනින් උකහා ගන්නා බැවිනි.

ලංකාව වැනි රටක ග්‍රාමීය පරිසරයට වඩා නාගරික පරිසරය සංකීර්ණ ය. ඊටත් වඩා බෙහෙවින් සංකීර්ණ වූවකි ඔබ අප ජීවත්වන මේ බටහිර සමාජ ය. එයිනුත් ලොව ප්‍රධාන නගරවලින් එකක් වන මෙය වඩාත් සංකීර්ණ ය. සිය ගණන් ජාතීන් ජීවත් වන, සිය ගණන් භාෂා හසුරුවන, එපමණක්ම සංස්කෘතීන්ගෙන් ගහණ, නානා ආගම් අදහන මේ විෂම සමාජය නමැති සැඩපහරට හසු නොවී මෙය තරණය කරන්නේ කෙසේද? විශේෂයෙන් තම දූ පුතුන් මින් බේරාගෙන ප්‍රවේශමෙන් එතෙර කරවන්නේ කෙසේද? යන්න දෙමාපියන් බුද්ධිමත්ව කල්පනා කළ යුතුව ඇත.

එසේම මෙම විෂම සමාජ සැඩපහරට අසුවූවෙකු හට තමන්ට අනන්‍ය වූ ආගමක් හෝ දහමක් හෝ භාෂාවක් හෝ සංස්කෘතියක් හෝ නැත යන සිතුවිල්ලෙන් යුතු සියල්ල මිශ්‍ර වූ අමුතුම ආකාරයේ අයද ඔබට මුණ ගැසෙනු ඇත. එම භයානක තත්වයට වගකිව යුත්තේ නොදැනුවත්කම තුළින් එවැනි සමාජයකට අනුගත වන අහිංසක දරුවන් නොව පුහු ආටෝප වලින් තම නිසරු බව සරුකර ගන්නට වෑයම් කරන වැඩිහිටියන් ය.

මෙහි පළමුවන කරුණ ලෝක යාත්‍රාවයි. මින් අදහස් කරන්නේ කෙනෙකුට තම ජීවිකා වෘත්තිය පවත්වාගෙන යාමට නිසි පරිසරයක් අවශ්‍ය බවයි. අසහනකාරී පරිසරයක් තුළ එවැන්නක් කිරීම උගහට ය. ඊළඟ කාරණාව බුදු දහමේ පවා ලෝක පාලන ධර්ම දෙක ලෙස හඳුන්වන ලැජ්ජා, බිය දෙකයි. ලැජ්ජා, බිය ආරක්ෂා වන විධියේ වට පිටාවක් තිබිය යුතු ය. මෙය මතු පිටින් පෙනෙන අදහසට වඩා ගැඹුරු අර්ථයකින් යුතුව ඉදිරිපත් කොට ඇත. ලැජ්ජා භය දෙකින් තොරව ජීවත්වීමට ඇති පරිසරය ඉතා භයානක වූවකි.

ඊළඟ කාරණා දෙක අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා කෙරෙහි දයාවෙන් කටයුතු කිරීමේ පරිසරයයි. මෙවැනි කාරණා පහකින් පරිපූර්ණ වූ සමාජය, ප්‍රදේශය හෝ පරිසරය කාටත් හිතකර ය. සුභදායක ය. එවැනි පරිසරයකින් බිහිවන මිනිසා කණාටු වී අකලට මියයන ගසක් මෙන් නොව සාරවත්ව වැඩී එල දරණ මහා වෘක්ෂයක් බඳුය.



♦ ***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue**
**London W41UD UK**

**ANOOMA & HEGODA**
**Solicitors**
**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 0 2 0 8 3 4 8 7 7 7 2**
**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**